පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

ශ්‍රේණිය - 9

ජුලි මාසය 04

ර/කරවිට මධ්‍ය විද්‍යාලය

සැකසුම - එල්. මහේෂ් විජේවර්ධන

| | | |
|---|---|---|
| නිපුණතාවය | - | නිෂ්පාදනය හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණය කරයි. |
| නිපුණතා මට්ටම | - | විවිධ අවශ්‍යතා සඳහා ලේබල් හා පෝස්ටර් චිත්‍ර නිර්මාණය කරයි. |
| ක්‍රියාකාරකම | - | ලේබල් නිර්මාණය කරමු. |
| පැවරුම | - | පහත පියවර අනුව ලේබල් නිර්මාණය කරන්න. |
| පියවර 1 | - | ඔබ නිවසේ ඇති විවිධ නිෂ්පාදන භාණ්ඩ කිහිපයක ලේබල් කිහිපයක් සපයා ගන්න (සැමන් ටින් ලේබල්, ආහාර පැකට් ලේබල් ) |
| පියවර 2 | - | එම ලේබල්වල සඳහන්ව ඇති දෑ අක්ෂරවල හැඩය, භාවිතා කර ඇති වර්ණ, ප්‍රමාණය, නිර්මාණාත්මක බව නිෂ්පාදනය සමග ගැලපීම ආදිය හොඳින් අධ්‍යයනය කරන්න. |
| පියවර 3 | - | ඔබ අධ්‍යයනය මඟින් ලබාගත් දැනුම අනුව කවකටුව, මිනුම් උපකරණ භාවිතා කොට ඔබ විසින් නිර්මාණය කරගත් නිෂ්පාදනයක් සඳහා ලේබලයක් සැලසුම් කරන්න. |
| පියවර 4 | - | ඔබගේ අඳින කඩදාසිය ගෙන එහි මිනුම් නිවැරදිව භාවිතා කරමින් සැලසුම් කළ ලේබලය එහි නිර්මාණය කරන්න. |
| පියවර 5 | - | ඔබ නිෂ්පාදනයට ගැලපෙන පරිදි රූප සටහන් වර්ණ ආදිය යොදාගනිමින් නිර්මාණාත්මකව තම ලේබලය නිමා කරන්න. |